17

# සුන්නතයෙහි වැදගත්කම

**වැඩසටහන් සම්පාදක:** ආදරණීය අසන්නෙනි, අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු නද්වතුත් තුල්ලාබ් සති අන්ත මුස්ලිම් තරුණ වැඩසටහන සඳහා ඔබ සැම සාදරයෙන් පිළිගන්නෙමු. සුපුරුදු ලෙස අදත් මෙම වැඩසහටහන ඔස්සේ ඉස්ලාමයේ මූලිකාංග පිළිබඳ ශිෂ්‍ය සමාජයට පැහැදිලි අවබෝධයක් ලබා දීමටයි අපේ සූදානම. අදත් මෙම වැඩසටහනේ අදහස් හුවමාරුව උදෙසා අමුත්තකු වශයෙන් එක්වන්නේ මෞලවි අබ්දුල්ලාහ් තුමන් ය. මෞලවි තුමනි, අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු.

**මෞලවි තුමා:** ව අලයිකු මුස්සලාම් වරහ්මතුල්ලාහි වබරකාතුහු

**වැඩසටහන් සම්පාදක:** අසන්නනි, පසුගිය වැඩ සටහනේ දී අපි ඉස්ලාමයේ ප්‍රධාන මූලාශ්‍රයක් වශයෙන් අල් කුර්ආනයේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කළෙමු. අද අපි සුන්නාහ්වේ වැදගත්කම පිළිබඳ මෙම වැඩසටහන ඔස්සේ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු. මෞලවි තුමනි, සුන්නාහ් යනු කුමක් දැයි පැහැදිලි කළ හැකි ද?

**මෞලවි තුමා:** සුන්නාහ් යනුවෙන් හැඳින්වෙන්නේ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ජීවිතයයි. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ වචන, ක්‍රියා, අනුමත කිරීම, ගුණාංග සහ වර්ණනා සියල්ල සුන්නාහ් යන පදයෙන් හැඳින්වෙන බව ඉස්ලාමීය විද්වත්හු සඳහන් කරති. හදීස් යන පදයත් බොහෝ විට මෙම අරුතෙන් ම භාවිත කෙරෙයි. අප සමාජයේත් සුන්නාහ් යන පදයට වඩා හදීස් යන පදය ප්‍රසිද්ධ වී ඇත.

මෞලවි තුමනි, අල් කුර්ආන් සහ සුන්නාහ් අතර ඇති

**වැඩසටහන් සම්පාදක:** සම්බන්ධතාව මඳක් විස්තර කළ හැකි ද?

**මෞලවි තුමා:** හොඳ ප්‍රශ්නයක්. මේ දෙක අතර කිට්ටු සබඳතා දක්නට තිබේ. අල් කුර්ආන් හා සුන්නාහ් වහී පදනම් කොට බිහිවූවක් වේ. අල් කුර්ආනය වහී මත්ලූ: වශයෙනුත් සුන්නාහ් වහී හයිරු මත්ලූ: වශයෙනුත් පවතී. අල් කුර්ආනය පවසන කරුණු නිවැරදි ව අවබෝධ කර ගැනීමටත්, ඒවා නිසි ලෙස ක්‍රියාවට නැඟීමටත් සුන්නාහ් අත්‍යවශ්‍ය වේ. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ජීවිතය සම්බන්ධයෙන් විමසූ විට එතුමාගේ ජීවිතය අල් කුර්ආනය සේ ම පැවැති බව ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය පැවසුවා ය.

**වැඩසටහන් සම්පාදක:** අල් කුර්ආනය පිළිපැදීම අපගේ මූලික වගකීමක් බව පසුගිය වැඩසටහනේ දී විස්තර කළා. එසේ ම සුන්නාහ් පිළිපැදීම පිළිබඳවත් අපට විස්තර කරන්න.

**මෞලවි තුමා:** නියත වශයෙන් ම සුන්නාහ් යනු ඉස්ලාමයේ දෙවන නීති මූලාශ්‍රයයි. නීති මූලාශ්‍රය යනු අපගේ දිවි පැවැත්මට අදාළ ආගමික නීති ලබා ගන්නා ප්‍රධාන උල්පතක් ලෙස පැවසිය හැකි ය. එසේ ම සුන්නාහ් පිළිපැදීම සෑම මුස්ලිම්වරයකුගේ ම වැදගත් වගකීමක් වේ. අල්ලාහ්ට කීකරු වන්නා සේ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාටත් අප කීකරු ව කටයුතු කළ යුතු ය. මේ පිළිබඳ අල් කුර්ආනයේ විවිධ ස්ථානවල අවධාරණය කොට තිබේ.

"ඔබ අල්ලාහ්ටත් ඔහුගේ දූතයාටත් කීකරු ව කටයුතු කරන්න." (අල් කුර්ආන් 03 : 32)

"එමෙන් ම අපගේ දූතයා ඔබට ප්‍රදානය කළ දෑ ඔබ සතුටින් භාර ගන්න. ඔහු ඔබට කුමක් වැළැක්වූයේ ද එයින් ඔබ ඉවත්වන්න" (අල් කුර්ආන් 59 : 07)

**වැඩසටහන් සම්පාදක:** සුන්නාහ් පිළිපැදීමේ වැදගත්කම පිළිබඳ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ දේශනා පිළිබඳ විස්තර කරන්න.

**මෞලවි තුමා:** ඔව් බොහෝ අවස්ථාවල මේ පිළිබඳ අවධාරණය කොට ඇත. උදාහරණයක් වශයෙන් මේ හදීසය බලන්න."මා ඔබ අතර කරුණු දෙකක් අතහැර යමි. ඒවා දැඩි ව ගෙන ක්‍රියා

කළේ නම් කිසි ද නොමග නොයන්නේ ය. එකක් දේව ආගම, (අල් කුර්ආනය) අනික මගේ මඟ පෙන්වීම,(සුන්නාහ්) වන්නේ ය. (මුවත්තා) මෙහි ඇති තවත් එක් වැදගත් කරුණක් වනුයේ මෙම හදීසය නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ අවසාන හජ් දේශනයේ අඩංගු වීම ය."

**වැඩසටහන් සම්පාදක:** නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මිනිසකු වුවත් දේව දූතයකු වශයෙන් එතුමාගේ වදන් කෙතරම් වැදගත් මෙන් ම ශ්‍රේෂ්ඨ ද යන්න පිළිබඳ විස්තර කළ හැකි ද?

**මෞලවි තුමා:** ඔව් නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ වදන් වහී වලට අනුකූල ව තිබූ බව බැලුවෙමු. අල්ලාහ්ගේ කැමැත්තට පටහැනි කිසිවක් එතුමා නො පවසයි. පහත අල් කුර්ආන් වැකියෙන් ද මෙය පැහැදිලි වේ.

"ඔහු තම කැමැත්තට කිසිවක් ප්‍රකාශ නො කරයි. ඒ සියල්ල ඔහු වෙත වහී මගින් ප්‍රදානය කළ ඒවා වේ." (53 : 03)

එසේ ම නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ වදන් කෙටි වුව ද පුළුල් අර්ථයක් ඇත. එනම් අඩු වදන්වලින් පුළුල් අවබෝධයක් සහිත කරුණු ප්‍රකාශ කරයි. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ සම්පූර්ණ ජීවිතය ම සාක්ෂි සහිත ව සටහන් කොට තැන්පත් කර තිබීම තවත් සුවිශේෂී කරුණකි. ලොව අන් කිසි ම කෙනකුගේ වදන් හා ඉතිහාසය මෙලෙස සූක්ෂම ලෙස නිරීක්ෂණය කොට පරිපූර්ණ සහ නිවැරදි ව ලේඛන ගත කොට සුරක්ෂිත කර නැත. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් අල්ලාහ්ගේ උපකාරයෙන් අනාගතයේ සිදුවීමට ඇති කරුණු පිළිබඳ පෙර දැනුම් දීම් කර ඇත . ඒවා එතුමාණන් පැවසූ අයුරින් ම සිදු වී ඇත .

**වැඩසටහන් සම්පාදක:** මෞලවි තුමනි, අල් කුර්ආනයට අර්ථ දැක්වීමක් ලෙස සුන්නාහ් පවතින බව ඔබ පැවැසුවා. එය මඳක් විස්තර කරන්න.

**මෞලවි තුමා:** උදාහරණයක් ලෙස අල් කුර්ආනය සලාතය ඉටු කරන ලෙස අණ කොට ඇත . එය ඉටු කරන්නේ කෙසේ දැයි සුන්නාහ්වේ පැහැදිලි කොට ඇත . එලෙස ම සොරාගේ අත කපා දමන ලෙස කුර්ආනය අණ කොට ඇත .නමුත් එය කුමන අවස්ථාවල ඉටු කරන්නේ දැයි සඳහන් කොට ඇත්තේ සුන්නාහ්වේ ය.

**වැඩසටහන් සම්පාදක:** මෞලවි තුමනි, අවසාන වශයෙන් සුන්නාහ් සම්බන්ධ අපට ඇති වගකීම් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

**මෞලවි තුමා:** සුන්නාහ් ඉගෙනීම, වනපොත් කිරීම, එය ක්‍රියාවට නැගීම, අන් අයටත් පැවසීම යන විවිධ වගකීම් අපහට ඇත . අල් කුර්ආනය වගේ ම සුන්නාහ්වත් මුළුමනින්ම පිළිපැදීමට උත්සාහ කළ යුතු ය. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ සුන්නාහ් වේ ඇතුළත් නොවන දෑ එතුමා පැවසුවේ යැයි අන් අයට ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිමත් අප සුන්නාහ්වට කරනු ලබන වගකීම වේ.

**වැඩසටහන් සම්පාදක:** අසන්නෙනි, අද දින වැඩසටහනෙන් සුන්නාහ් පිළිබඳ හා එය පිළිපැදීමේ අවශ්‍යතාව පිළිබඳ සරල පැහැදිලි කිරීමක් අපි ලබා ගත්තෙමු. අප උගත් කරුණු අප ජීවිතයේත් පිළිපදින්නට අධිෂ්ඨාන කර ගනිමු. මෙහි අපගේ ආරාධිතයකු ලෙස පැමිණ ආකර්ෂණීය විස්තරයක් ඉදිරිපත් කළ මෞලවි අබ්දුල්ලාහ් තුමන්ට අපගේ ස්තුතිය, ජසාකල්ලාහු හයිරන්.

**මෞලවි තුමා:** බාරකල්ලාහු ලක.

### අභ්‍යාසය

1. සුන්නාහ් යනු කුමක් ද?
2. සුන්නාහ් යන අදහස දෙන වෙනත් පදයක් ලියන්න.
3. අල් කුර්ආනය හා සුන්නාහ් අතර ඇති සබඳතා තුනක් සඳහන් කරන්න.
4. සුන්නාහ් පිළිපැදීමට බල කරන කුර්ආන් වැකියක් සහ හදීස් සාධකයක් දක්වන්න.
5. අපට සුන්නාහ් සම්බන්ධව ඇති වගකීම් මොනවා ද?